**පුරවැසි අධ්‍යාපනය** **11 ශ්‍රේණිය**

## පෙරහුරු පරීක්ෂණය

### II කොටස

---

01 (i) බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් 02ක් නම් කරන්න.

(ii) ඡන්ද කොට්ඨාස අනුව ජනතා නියෝජිතයන් තෝරා පත්කර ගැනීම නිසා අත්වන ප්‍රයෝජන 02ක් ලියන්න.

(iii) සංවර්ධනය කරා පියනගන රටක් ලෙස ශ්‍රී ලංකාව ඇසුරෙන් හඳුනා ගත හැකි සුවිශේෂී ලක්ෂණ 02ක් සඳහන් කරන්න.

(iv) ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය සතු කාර්යයන් 02ක් ලියන්න.

(v) රාජ්‍යයේ වගකීම් 02ක් ලියන්න.

(vi) ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා පාර්ලිමේන්තු පනත නම් කරන්න.

(vii) බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම වෙනුවෙන් පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග 02ක් ලියන්න.

(viii) කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන එක බැගින් ලියන්න.

(ix) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාව තුළ සිදුව ඇති වෙනස්කම් 02ක් ලියන්න.

(x) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වගන්තියේ සඳහන් මූලික යුතුකම් 02ක් ලියන්න.

(ලකුණු 02×10=20)

02 (i) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ග්‍රීසියේ පැවැති "පොලිස්" හෙවත් නගර රාජ්‍ය 02ක් නම් කරන්න.

(ලකුණු 02)

(ii) රාජ්‍යයක් සමන්විත වන ප්‍රධාන අංග අතුරෙන් 03ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සන්ධීය රාජ්‍යයක ලක්ෂණ 03ක් දක්වා ඉන් එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

03. (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ජන මාධ්‍ය ක්‍රියා කළ යුතු ආකාරය නිදසුන් 02ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(ii) අධිකරණයේ ස්වාධීනත්වය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවැත්ම සඳහා ඉවහල් වන අයුරු කරුණු 02ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් යටතේ නීතියේ ආධිපත්‍යය පවතින බව පෙන්වා දීමට ඉදිරිපත් කළ හැකි කරුණු 02ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) ශ්‍රී ලාංකික පුරවැසියන්ට ඡන්දය භාවිත කිරීමට අවස්ථාව ලැබෙන මැතිවරණ 02ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සාධාරණ මැතිවරණයක පැවතිය යුතු ලක්ෂණ 02ක් දක්වා එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 03)

(iii) මැතිවරණ සීමා නිර්ණය කොමිසමේ කාර්යභාරය දක්වා එහිදී සැලකිලිමත්වන කරුණු පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

05. "ජාතික රාජ්‍ය සංකල්පය තුළින් ගම්‍ය වනුයේ එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන අදහසයි"

(i) ජාතික රාජ්‍ය බිහි වීමට බලපෑ හේතු 02ක් දක්වන්න. (ලකුණු 02)

(ii) රාජ්‍ය හා ආණ්ඩුව අතර පවතින වෙනස්කම් 03ක් ලියන්න. (ලකුණු 03)

(iii) ආණ්ඩුව සමන්විත වන ප්‍රධාන ආයතන නම් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

06. "නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ. එබැවින් සෑම පුරවැසියකුම නීතිය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත යුතුය."

(i) නීතියේ ගුණාංග 02ක් ලියන්න. (ලකුණු 02)

(ii) අපරාධ නීතිය යටතේ දඬුවම් ලබා දෙන වැරදි 03ක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ ආයතන 03ක් නම් කොට ඉන් එකක ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. (i) ඡන්දදායකයින් ඡන්දය භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු ප්‍රධාන කරුණු 02ක් ලියන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ ක්‍රියාත්මක දේශපාලන පක්ෂ ක්‍රම අතරින් 03ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකින් යුතු රාජ්‍යයක යහපාලනය ක්‍රියාවට නැංවීමේ දී රාජ්‍ය සේවාව සතු වගකීම් පිළිබඳව කරුණු 03ක් දක්වා එක් කරුණක් විස්තර කරන්න. (ලකුණු 05)